

"පැලේඩියම් ක්‍රමයේ" නිර්මාතෘන් සිව්දෙනා

පැලේඩියම් යනු විශ්වාසවන්තභාවය ගැන නිවැරදි අවබෝධයක් ලබා ගත හැකි ක්‍රමයකි. ඔබ කරන්නෙන් කුමක්දැයි ඔබට මතක් කර දෙන පැලේඩියම් උපාංගය ඔබගේ පරිගණකය සිසාරා ගොස් එයට රිංගන හෝ එය විසින් ග්‍රහණය කර ගනු ලබන තොරතුරු ලැබෙන්නේ කාගෙන් ද, ලැබෙන්නේ කොතැනින් ද යන්න ඔබට පවසයි.

# පරිගණකයෙන් ඔබගේ අනන්‍යතාව මුර කරන "පැලේඩියම්" ක්‍රමය

පරිගණක භාවිතය ශීඝ්‍රයෙන් ප්‍රචලිතවත් ම සයිබර් සොරුන් හෙවත් පරිගණක සේවා සපයන ආයතනවල සිටින තොරතුරු සොරකම් කරන්නන් විසින් ණයවර කාඩ්පත් අංක සහ ආයතනික රහස් ඩැහැ ගැනීම ද ඒ සමගම ප්‍රචලිත විය. වෙබ් අඩවියක් සඳහා දුරස්ථ පාලකයක් ක්‍රමලේඛ (Programme) කරනවාට වඩා පහසුවෙන් එය ව්‍යර්ථ කිරීම කළ හැකි ය. අන්තර්ජාලය ඔස්සේ චිත්‍රපට සහ සංගීතමය වැඩසටහන් වඩ වඩාත් බහුලව නිදහසේ ගලා යෑම නිසා සංගීත, චිත්‍රපට සහ ටෙලි නාට්‍යය මංකොල්ලකාර "කෝඩ්බාර්" විසින් සිය මඩිය තර කර ගැනීමට සමත් වූහ. සිය රහස්‍ය තොරතුරු අන්‍යයන් අතට පත් වීම ගැන පරිගණක ග්‍රාහකයෝ මැසිවිලි නැගූහ. ඒ අතර ම ඉතා වේගයෙන් පරිගණක වෛරස රිංගීමටත් වැඩසටහන් හිටි අඩියේ ම නතර කිරීමටත් පටන් ගත් බැවින් මෙම වංචනික තොරතුරු සොරුන්ගෙන් ග්‍රාහකයින් බේරා ගැනීම ගැන මයික්‍රොසොෆ්ට් පරිගණක ප්‍රබලයා අධ්‍යයනය කළේ ය.

පරිගණක භාවිතය සීමා කිරීමක් මේ තොරතුරු ඩැහැ ගැනීම ගැන පවත්නා බිය නිසා ඇතිවන බව මයික්‍රොසොෆ්ට් සමාගම පවසයි. එබැවින් "විශ්වසනීය පරිගණක භාවිතාවක්" සඳහා සටන් වදින සංවිධානයක අවශ්‍යතාව ඔවුන් මතු කළේ ය. එබැවින් මිත්මතු ඔවුන් පුද්ගල පරිගණක නිපදවීමේ දී නව ආරක්ෂිත උපක්‍රමයක් හඳුන්වා දී තිබේ. මෙම නව ක්‍රමය මුල්වරට මාධ්‍යයක් වෙත අනාවරණය වූයේ ආරක්ෂාව, රහස්‍යභාවය සහ බුද්ධිමය දේපළ යනාදී ක්ෂේත්‍රයන් ආවරණය වන ක්‍රමයක් ලෙසිනි. මෙම නව උපක්‍රමය පැලේඩියම් නමින් හඳුන්වා දෙයි. මෙය "කෝකටත් තෛලයක්" වශයෙන් මයික්‍රොසොෆ්ට් සමාගම හඳුන්වා නොදුන්න ද පුද්ගල සහ ආයතනික තොරතුරු රැක ගැනීමට ඔවුන් අත ගැසූ දැඩි අවදානමක් සහිත ව්‍යාපෘතිය මෙය බව ද පවසයි.

"මේක ගැටළු විසඳන මෙවලමක් නොවෙයි. නමුත් මිනිසුන්ගේ එදිනෙද කටයුතුවලදී පරිගණක භාවිතය වඩා ක්‍රමවත් කිරීමත් ග්‍රාහකයන්ගේ තොරතුරුවල රහස්‍යභාවය සුරැකීමත් පිළිබඳ ආරක්ෂාව ගැන සිතන්න අලුත් පැතිකඩක් විවර කිරීමක් පමණ යි." නිමැවුම් කළමනාකාර මාරියෝ ජුරේස්(Mario Juarez)පවසයි. මින් ඉදිරියට, අපට සිතා ගැනීමටත් නොහැකි මට්ටමේ නව උපක්‍රම සෙවීමට සැවොම උත්සුක වනු ඇතැයි ද ඔහු පවසයි. මක් නිසා ද මෙහි සාර්ථක බව රැඳී පවතිනුයේ මේ පහසුකම කොතැනත් දක්නට ලැබෙන (Ubiquity)මට්ටමට පත්වීමෙනි.

ඇතැම්විට මෙය මූලික මට්ටමේදී අසාර්ථකවීමටත් හැකියැයි පවසන මයික්‍රොසොෆ්ට් උප සභාපති විල් පූල් (Will Poole) "අපට මෙම

ක්ෂුක්ෂම චිප්ස් මිලියන 100 ක් වත් නැව්ගත කළ පසුව යි එය භාවිතා කරන්නන් හට යම් වෙනසක් දැනුනා දැයි දැකිය හැක්කේ" යැයි වැඩ්දූරටත් පවසයි.

"ඒ නිසා තමයි අපට මේ සඳහා චිප්ස් මහා පරිමාණයෙන් නිපදවන්නන් සමඟ හවුල් ව්‍යාපාරයකට එළැඹීමට සිදු වූයේ දැනටමත් මෙම පද්ධතියට ආවේනිකව නිමැවූ චිප්ස් පමණක් විශේෂයෙන් නිපදවීම සඳහා සමාගම් දෙකක් සමග ගිවිසුම් අත්සන් තබා තිබෙනවා."

"මෙය ලොව හොල්ලන ව්‍යාපාරික ව්‍යායාමයක් විය හැකියි" විල් පුල් උදම් අනයි. "මෙම නව උපක්‍රමික උපාංග හඳුනාගත හැක්කේ එහි වේගවත් බව මගින් නොව ආරක්ෂිත බවෙනි.

මෙහි අනෙක් පියවර වන්නේ Dell, HP සහ IBM පරිගණක නිපදවන සමාගම්වල ඔවුනගේ පුද්ගල පරිගණක මේ නව ආරක්ෂිත උපාංගයට ගෙවැදීමට සරිලන අයුරින් යළි නිපදවීමට කැමැත්ත ලබා ගැනීම යි. ඔහු වැඩ්දූරටත් පැවසීය. "මෙවැනි සංකීර්ණ කටයුත්තක් පුද්ගල පරිගණක සම්බන්ධයෙන් මීට පෙර අත ගසා නැත."

මේ නව එකතුවත් සමඟ ඔබගේ මිළගා පරිගණකය දැනට වඩා ස්වල්පයක් මිල අධික වීමට පුළුවන. මෙම කාර්යය සාර්ථක වුවහොත් නව පරිගණකයට ඇති ඉල්ලුම පුදුමාකාර වනු ඇත.

මෙම නව පැලේඩියම් උපාංගය සවි කළ පසු ඔබගේ පුද්ගල පරිගණකයෙන් ලබා ගත හැකි අමතර ප්‍රයෝජන රාශිය අතර

*** ඔබ කටයුතු කරන්නේ කවරකු සමග ද :-**

ඔවුන් කරන්නේ කුමක් ද යන්න ඔබට පවසයි.

පැලේඩියම් යනු විශ්වාසවන්තභාවය ගැන නිවැරදි අවබෝධයක් ලබා ගත හැකි ක්‍රමයකි.

ඔබ කරන්නෙත් කුමක්දැයි ඔබට මතක් කර දෙන පැලේඩියම් උපාංගය ඔබගේ පරිගණකය සිසාරා ගොස් එයට රිංගන හෝ එය විසින් ග්‍රහණය කර ගනු ලබන තොරතුරු ලැබෙන්නේ කාගෙන් ද, ලැබෙන්නේ කොතැනින් ද යන්න ඔබට පවසයි.

*** ඔබගේ තොරතුරු ආරක්ෂාකර දෙයි**

තොරතුරු මුදා තැබිය හැකි අන්දමේ ඉහළ මට්ටමේ රහස්‍ය තොරතුරු ගබඩා ක්‍රමයක් සහිත බැවින් හොර රහසින් රිංගා පරිගණක තොරතුරු සොරකම් කරන්නන්හට වැට බැඳේ.

ඒ වගේම ඔබ විසින් ගබඩා කළ ලියකියවිලිවල තොරතුරු ඔබට හොරා වෙනස් කළ නොහැකි ය.

*** වෛරස සහ පනුවන්ට රිංගාගත නොහැකි ය :-**

ඔබ අවසර ලබා නොදෙන කිසිදු ක්‍රමලේඛයක් පැලේඩියම් මගින් ක්‍රියාත්මක නොකරන බැවින් ඔබගේ පරිගණකයේ ආරක්ෂිත කොටස් බාහිර වෛරස වලින් රැක දෙයි.

*** මුද්‍රක තීන්ත නොමැතිව වුවත් පණිවුඩ රැස් කර තබා ගත හැකි වීම :-**

මුද්‍රකයේ තීන්ත, කාබන් පටි ආදී අවශ්‍යතා නොමැතිව වුවත් ඔබගේ පරිගණකයට ඉන් බලපෑමක් නොවන පරිදි කල් තියා දැන්වීමටත් එසේ අක්‍රිය අවස්ථාවක දී ඔබට අවශ්‍ය ලිපි ආදිය කියවීමට අවශ්‍යනම් කියවා බැලීමටත් හැකියාව ලැබේ.

*** රහස්‍යභාවය රැක දෙයි :-**

පැලේඩියම් මගින් ඔබගේ පරිගණකයේ දත්ත මුද්‍රා තබා රැක ගැනීමට කටයුතු කරනවාක් මෙන් ම ඔබගේ අවසරය ඇතිව ඔබ මුදාහරින්නට කැමති තොරතුරු ඔබ නොමැතිව වුවත් ඔබ විසින් නම් කරන නියෝජිතයකුට මුදා හැරිය හැකි ය. උදාහරණයක් වශයෙන් ඔබට බැංකුවක් සමග ගනුදෙනු කිරීමක දී ඔබේ යම් තොරතුරු ප්‍රමාණයක් බැංකුවට ලබා දිය යුතු නම් මෙහි My man නැමති කොටසින් එය ලබා ගන්න යැයි බැංකුවට ඉඩ ලබා දිය හැකි ය. බැංකුව ඔබගේ My man මගින් තොරතුරු ලබාගන්නා විට ඔබ විසින් බැංකුවට දැන්වීමට අවසර ලබා දී ඇති තොරතුරු පමණක් බැංකුව වෙත නිදහස් කෙරේ. අනෙකුත් කිසිදු තොරතුරක් බැංකුවට හෝ බාහිර පුද්ගලයකුට කියවීමට හෝ ලබා ගැනීමට නොහැකි ය.

*** ඔබ තොරතුරු යැවූ පසුව එය පාලනය කරයි :-**

පැලේඩියම් උපාංගය තුළ පවතින DRM හෙවත් Digital Rights Management ක්‍රමය තුළින්



සංගීත වැඩසටහන් සහ චිත්‍රපටි බෙදා හැරීම සඳහා චිත්‍රාගාර සහ ශබ්දාගාර වෙත ලබාදිය හැකි ය. ඒ අනුව එය කොපමණ කාලයක් නොමිලේ බැලීමට ඉඩ දී ගනුදෙනුව තීරණය කර එතැන් පටන් කොටස ධාවනය නතර කිරීමට වුවත් සැලසුම් කර තැබිය හැකි ය. මුදල් ගෙවන්නේ නම් දිගට ම ධාවනය කිරීම ද සිදු කළ හැකි ය.

"මේක කදිම වැඩක්" බිල් ගේට්ස් පවසයි.

"සාමාන්‍ය ජනතාවටත් DRM පහසුකම් ලබා දිය හැකි යි. සංගීත හෝ චිත්‍රපටි පමණක් නොවෙයි (e-mail) ඉලෙක්ට්‍රොනික තැපැල් ලිපි සහ අනෙකුත් ලිපි සඳහාත් මේ පහසුකම යොදගත හැකි යි." එවිට වෙනත් පාර්ශවයකට එය පිටපත් කර ගැනීමට හෝ හිමිකරුට හොරෙන් වෙනත් අයෙකුට ලබා දීමට හෝ නොහැකි ය. වෙනත් උදාහරණයක් දක්වතොත් අද මුද්‍රණය කරන ලියැවිල්ලක් තවත් සතියක් යනතුරු කියවීමට නොහැකිවන පරිදි අද දින යටතේ ගබඩා කර තබා ස්වයංක්‍රීයව එදිනෙන් පසු කියවිය හැකි වන පරිදි විධානයක් ලබාදිය හැකි ය. මේ සෑම දෙයක් ම තීරණය කළ යුත්තේ පරිගණකය පාවිච්චි කරන්නා විසිනි.

මෙම සිද්ධාන්තයේ ඇතැම් දනුම මීට වසර 25 තරම් පැරණි ය. බුද්ධිමය දේපළ ආරක්ෂා කිරීමේ උපක්‍රම අධ්‍යයනය කිරීමට ක්‍රම සහ විධි සෙවූ පීටර් බිඩල් තම අධ්‍යයන සඳහා පෝල් ඉංග්ලන්ඩ් සහ ජෝන් මැනර්ඩේලි නමැති මෘදුකාංග පර්යේෂකයින්ගේ ද සහාය ඊට ලබා ගති. බුද්ධිමය දේපළ හා ආරක්ෂාව සහ රහස්‍යභාවය අතර ඇති බැඳියාව ඔවුන් ග්‍රහණය කර ගෙන තිබුණි.

තොරතුරු සොරුන් සහ හොරෙන් පරිගණකයට ඇතුළු වන්නන් වැළැක්වීමට අවශ්‍ය නම් මේ නව උපාංගය නොව පද්ධතියේ කොටසක් සිලිකන්වල බහා තැබිය යුතු බවත් (එනම් සිලිකන් ආලේපිතව නිෂ්පාදනය කළ යුතු බවත්) ඔවුන් වටහා ගත්හ. මේ හේතුව නිසා ඔවුන්ගේ ඉලක්කය තවත් බැරෑරුම් විය. නව උපාංගය වෙළෙඳපොළ මට්ටමින් එළිදැක්වීමට සමගාමීව පුද්ගල පරිගණක මෙම සිලිකන් සාත්තුව සඳහා යොමු කරන ලෙස ඒවා හිමිකරුවන්ගෙන් ඉල්ලා සිටීම ද කළ යුතු විය.

Intel මෘදුකාංග නිෂ්පාදන සමාගම මුලින් ම මෙය බාර ගැනීම ද ප්‍රතික්ෂේප කළත් පසුව ඊට ලොල් විය. AMD සමාගම ද එපරිද්දෙන් ම මන්දගාමීව අවතීර්ණය වී දැන්

බැංකු ඇතුළු මූල්‍ය ආයතන, සෞඛ්‍ය සේවා සහ රහස්‍යතාව රැක ගැනීමට අවශ්‍ය වන ගනුදෙනු සිදු කරන රාජ්‍ය ආයතන යනාදිය මේ නව ක්‍රමය මුලින් ම යොද ගනු ඇත. අනතුරුව තොරතුරු තාක්ෂණ සමාගම් සිය ජාලයන් අනෙකුත් තරගකාරී සමාගම්වලින් ආරක්ෂිතව පවත්වා ගෙන යෑම සඳහා මේ ක්‍රමය සම්බන්ධ කර ගනු ඇත.

යුහුසුළුව ක්‍රියාත්මක වේ. බිඩ්ල්ගේ කණ්ඩායම අඛණ්ඩ පර්යේෂණවල යෙදී 2001 ඔක්තෝබර් මාසයේ දී ශක්‍යතාවකින් යුතු ව්‍යාපෘතියක් බවට මෙය පත් විය.

වසර 2004 දී පමණ Windows වර්ගයට එක් වූ නවීකරණ උපාංගයක් පරිද්දෙන් පැලේඩියම් මහා පරිමාණයෙන් වෙළෙඳපොළට නිකුත් වෙනු ඇත. ඒ සමගම තම පරිගණක විකිණීමට උත්සුක වන පරිගණක නිෂ්පාදන සමාගම් ද පැලේඩියම් ආරක්ෂිත උපාංගයට තම පරිගණකවල ඉඩකඩ වෙන් කරමින් එය සමන්විත වන ආකාරයෙන් නිපදවනු ඇත. ඊට අමතරව ඔබ විසින් පරිගණකයේ මුද්‍රණය කරන (යතුරු ලියන) තොරතුරු වෙනස් කිරීමට මාන බලන කුට පුද්ගලයින් (Wiretapping) එය වළක්වා ගැනීමට අවශ්‍ය උපාංග ද පරිගණකයට සවි කරනු ඇත.

බැංකු ඇතුළු මූල්‍ය ආයතන, සෞඛ්‍ය සේවා සහ රහස්‍යතාව රැක ගැනීමට අවශ්‍ය වන ගනුදෙනු සිදු කරන රාජ්‍ය ආයතන යනාදිය මේ නව ක්‍රමය මුලින් ම යොද ගනු ඇත. අනතුරුව තොරතුරු තාක්ෂණ සමාගම් සිය ජාලයන් අනෙකුත් තරගකාරී සමාගම්වලින් ආරක්ෂිතව පවත්වා ගෙන යෑම සඳහා මේ ක්‍රමය සම්බන්ධ කර ගනු ඇත. පැලේඩියම් ඒකක දසලක්ෂ ගණනින් වෙළෙඳපොළෙන් නිකුත් වූ විට පාරිභෝගිකයන් වඩ වඩාත් ඒ කෙරෙහි නැඹුරුවනු ඇත.

පැලේඩියම් ක්‍රමයට මාරුවීම පිළිබඳව සැක උපදවන පරිගණක සහ අන්තර්ජාල ගුරුවරුන් ද සිටිති. නමුත් මින් ලැබෙන අවාසිවලට වඩා වාසි ප්‍රමාණය වැඩි වනු ඇතැයි ඔවුන් පුරෝකතනය කරයි. "මේ ගැන පාරිභෝගිකයින් දැනුවත් කිරීමේදී අපි පාරදෘශ්‍ය අන්දමට කටයුතු කරනවා" Windows මහා පරිමාණයේ ව්‍යාපාරිකයකු වන ජීම් ඕල්චින් පවසයි. මේ නව ඒකකය එකතු කළ හැක්කේ Windows වර්ගයට පමණක් නිසා මෙමගින් Windows ඒකාධිකාරයක් හටගන්නා බව නම් සත්‍යයකි. "ඒක ඇත්ත,

අපි ඔබගේ දුරකතනයට හෝ අත් ඔරලෝසුවට සවි කරන්නේ නැහැනේ." මෘදුකාංග නිර්මාණකරුවකු වන බ්‍රයන් විල්මන් පවසයි.

ඇතැම්විට කිසියම් රටක ආණ්ඩුවක් විසින් පැලේඩියම් මගින් තොරතුරු උවමනාවට වඩා සීමා කරවන බවට තීන්දු කළහොත් කුමක් සිදු වේද? කෙසේවුවත්, ඇතැම් රටවල් ප්‍රසිද්ධ පුද්ගලයින්ගේ රහස් තොරතුරු සෙවීම තම අවශ්‍යතාවක් බවට පත් කර ගෙන සිටිති.

ග්‍රාහක පාරිභෝගිකයින්හට පහසුවෙන් පාවිච්චි කළ හැකි පරිදි පැලේඩියම් සකස් වේ ද? නැති නම් මේ නව ක්‍රමය අඩාල කරවනසුළු හෝ ව්‍යර්ථකරවන ආකාරයේ උපක්‍රමයක් ප්‍රසිද්ධියට පත් කළ හොත් මේ සමස්ථ ව්‍යායාමය ම ලත් තැන ම ලොප් වෙනවා නොවේ ද? මේ ආකාරයේ ගැටළු තවමත් නිරුත්තරව පවතී.

"අවසානයේ අප විසින් නැවිගත කරනුයේ විෂබීජ(bugs) සහිත නොගයක් විය හැකි ය කියා මා විශ්වාස කරනවා." පෝල් ඉංග්ලන්ඩ් විචිකිච්ඡාවෙන් පසුවෙයි. පැලේඩියම් ක්‍රමයේ අනාගතය පුරෝකතනයන්ට එරෙහි වනු ඇත. රහස්‍යභාවය පිළිබඳ ආරක්ෂාව ප්‍රචලිත කිරීමත්, කෙනෙකුගේ පුද්ගලික තොරතුරු පිළිබඳ පාලනය තීව්‍ර කිරීමත් පරිගණක තවදුරටත් සුරක්ෂිත භාවිතයට නැඹුරු කිරීමත් ඉතා හොඳ සොයා ගැනීම් ය. නමුත් කිසිවකු නොසිතන ආකාරයේ අනිටු විපාක ද ලැබිය හැකි ය. පුද්ගල තොරතුරු සඳහට ම මැකී ගියහොත්, මිය ගිය අයගේ, රහස් පරීක්ෂණ ඉතිහාසවලට සම්බන්ධ අයගේ තොරතුරු නැවත සොයා ගැනීම උගහට වනු ඇත. එනම් කඩදාසි ලිපිගොනුමත යැපීම පරිගණක භාවිතයට වඩා හොඳ යැයි මතයක් මතු වනු ඇත.

බොහෝ වානිජමය ගනුදෙනුවලට පළමුව එම පාර්ශවකරුවන්ගේ අනන්‍යතාව සහතික කර ගැනීමට සිදු වෙයි. මෙහිදී මයික්‍රොසොෆ්ට් පරිගණක මගින් පැලේඩියම් භාවිතයට අනුගත වූ විට මෙවැනි අවස්ථාවකදී ලැබිය හැකි වාසිය අතිමහත් ය.

ග්‍රීසියේ බලකොටු ඉදිරිපිට පිහිටි ඇතීනා දෙව්දුවගේ ප්‍රතිමාව, ආරක්ෂාවේ සංකේතයක් ලෙස සැලකූ අතර ඊට දුන් නම "පැලේඩියම්" ය. ඒ ආකාරයෙන් ම පරිගණක ක්‍රමලේඛ පාවිච්චියට ගන්නන්හට නව පැලේඩියම් ක්‍රමයෙන් අමතර ආරක්ෂාවක් සහතික වේ නම් පරිගණක ක්ෂේත්‍රයේ තවත් අඩුපාඩුවක් ඉන් පිරිමැසෙනු ඇත. ❑

**'නිව්ස්වීක් ඇසුරෙනි.'**
**සිංහලට නැගුවේ**
**ප්‍රියංකර ජයසිංහ ආරච්චි**